Page 4 Aug- Sep 2012.qxd 24/09/2012 11:30 Page 1



1 වන පිටුවෙන්.....

# ඔලිම්පික් පාඩම්!

ස්ථානය තීරණය කළේද ඒ සමයේදී ම ය. 2007 දී ලන්ඩනයට වරම ලැබුණු සැනින් ලන්ඩනයේ ඔලිම්පික් සංවිධායක කමිටුව වැඩේ ඇරඹූහ. ඔලිම්පික් තරඟමාලාවක් තබන්නට සුදුසු ක්ෂේත්‍රයක් සකස් කිරීම රටකට මහා අභියෝගයකි. එසේම 2012 අගෝස්තු වනවිට එය නිමකරගැන්මට හැකිවේදැයි බොහෝ විට ලන්ඩන් කමිටුවට ඇතිවූ සැකයකි. අවශ්‍ය සියල්ල කඩිනමින් සම්පාදනය කරගත්හ. ඊළඟ අවුරුදු පහ තුළ දිවා රෑ නොබලා ක්‍රියාකාරී වූහ. ඒ සියල්ල කිසිත් අඩුවක් නැතිව පිළියෙල කර ගත් අයුරු විස්මය දනවයි. නැගෙණහිර ලන්ඩනයේ නිමකරන ලද 80,000 ක ජනකායක් රැඳවියහැකි දැවැන්ත ඔලිම්පික් ක්‍රීඩාංගනය අද දකින කල අවුරුදු පහක් තුළ සියළු නවීන පහසුකම් කිසිත් අඩු නැතිව අවශ්‍ය ඔලිම්පික් ප්‍රමිතියට අනුව එවැන්නක් සාදා නිමකරන ලදැයි සිතන්නටවත් බැරි ය.

## ඔලිම්පික් සඳහා ලන්ඩනය තුළ කරන ලද විශේෂ ඉදිකිරීම්

ලක්ෂයක ජනකායක් රැඳවිය හැකි ක්‍රීඩාංගනයක්. ප්‍රේක්ෂකයින් 80,000 කට හිඳගැනීමට ආසන ද, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, නිලධාරීන්, සේවක සේවිකාවන්, හමුදා භටයින්, ආරක්ෂක නිලධාරීන්, ස්වේච්ඡා සේවකයින් ආදී සියළු ක්‍රියාකාරී පිරිස ද සමග මෙම විශේෂ ක්‍රීඩාංගනයේ ලක්ෂයක පිරිසක් අඩංගු වෙයි.

විවෘතකිරීමේ සහ නිමාකිරීමේ ප්‍රසංගය පැවැත්වීමට යෝග්‍ය විශාල වේදිකාවක්.

සාමාන්‍ය සහ ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා සාමාන්‍ය හා විශේෂ උපකරණ භාවිතයට සුදුසු ජවන හා පිටිය මළල ක්‍රීඩාවලට අවශ්‍ය බිම් තීරු සහ ධාවන පථ.

පිහිනුම් හා කිමිදුම් තටාක, බොක්සිං මල්ලව, කරාටේ, කරණම් හා පිනුම් (ජිම්නාස්ටික්) තරඟ සඳහා ක්‍රීඩා මණ්ඩප.

පාපන්දු, වොලිබෝල්, ටෙනිස්, රගර් ආදී තරඟ සඳහා සුදුසු ක්‍රීඩාංගන, තුරඟ කඩුලු පැනීම් සඳහා ඊට විශේෂ පිට්ටනි.

දුන්නෙන් විදීම්, ඉලක්කයට වෙඩිතැබීම් ආදියට සුදුසු ස්ථාන.

බෝට්ටු සහ කුඩා නාවික යාත්‍රා ධාවනතරඟ සඳහා ගංගාවල් ආශ්‍රිතව දහස් ගණන් ප්‍රේක්ෂක සමූහයකට නැරඹීමට සුදුසු සේ සකසන ලද ගංගාතීරු.

ඔලිම්පික් සඳහා සූදානම් වනවිට ඉහතකී දෑ පමණක් නොව ක්‍රීඩක ක්‍රීඩිකාවන්, සේවකපිරිස්, නිලධාරීන්ට රැස්වන ප්‍රේක්ෂකයින්ට ආහාරපාන සෞඛ්‍ය පහසුකම්, ඔවුන්ගේ ආරක්ෂාව ගැන සහතිකවීම පිළිබඳවද දැඩි ලෙස කල්පනාවට ගන්නට ලන්ඩනයේ කමිටුවට සිදුවිය.

## ඔලිම්පික් ගම්මානය

ක්‍රීඩාංගනය වටා ඇති නැගෙණහිර ලන්ඩනයේ ස්ට්‍රැට්ෆර්ඩ් පෙදෙස මුළුමනින්ම මේ සඳහා ලන්ඩන් නගර සභාව වෙන්කර දුන්නාය. ක්‍රීඩාංගනය වටා අක්කර ගණනක භූමි භාගයක ඔලිම්පික් ගම්මානයක් ඉදිවිය. එහි විවිධ රටවලින් පැමිණි 15,000 කට ආසන්න ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට නවාතැන් ගන්නට නිවාස ඉදිකරන ලදී. තැපැල්, බැංකු, දුරකථන සහ වෛද්‍ය පහසුකම්ද, විශේෂ පොලිස් කූටිද සැදිණ. ආරක්ෂක භටයෝද යොදවා සිටියහ. එහි සිට ක්‍රීඩාංගනයට පයින් ආ හැකි ය.

ගමනාගමන පහසුකම් ගැනද විශේෂ සැලකිල්ලක් දැක්විණ. ක්‍රමවත් දුම්රිය සහ බස්සේවා, එසේම මාවත්හි ඔලිම්පික් සඳහා යන අයට විශේෂයෙන් ලකුණු කළ ධාවන තීරුද, විශේෂ රථ ගාල්ද තනවන ලදී. ලන්ඩන් ගමනාගමන මණ්ඩලයේ සේවක සේවිකාවන් ඔලිම්පික් පිළිබඳව දැනුම්වත් කර ජනතාවට නිවැරදි තොරතුරු සැපයිය හැකි පරිදි ඔවුන් වසරකට පෙර සිට මණ්ඩලය මගින් මනාව පුහුණු කරන ලදී.

## සංඛ්‍යා ලේඛන වශයෙන්

ඔලිම්පික් ක්‍රීඩා තරඟමාලාව ඔලිම්පික් සහ පැරලිම්පික් වශයෙන් දෙකකට බෙදුණි.

ඔලිම්පික් තරඟ වර්ග 26 කි. පැරලිම්පික් තරඟ 20 කි.

ඒ කොටස් දෙකටම අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ මෙවර 14,700 ක් සහභාගි වූහ.

විවිධ අංශවලට අයත් දේශීය හා විදේශීය මාධ්‍යවේදීහු 21,000 ක් පැමිණ සිටියහ.

මිලියන **10 . 8** ක් ජනතාව ඔලිම්පික් තරඟ සඳහා ප්‍රවේශපත්‍ර මිළදීගෙන තිබුණි. එතරම් ප්‍රේක්ෂක සංඛ්‍යාවක් සහභාගිවූ ක්‍රීඩාංගනයේ කටයුතු හසුරුවන්නට 2,00000 (ලක්ෂ දෙකක) පිරිසක් වැඩෙහි යොදවන ලදී. එයින් 6000 ක් වැටුප් ලබන අයවූ අතර 70,000 ක් ස්වේච්ඡාවෙන් සේවය කළ අය වූහ. ඔලිම්පික් වලට සම්බන්ධවූ කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙන්වන ලද ඔවුන්ගෙන් වැටුප් ලබන ලක්ෂයකට ආසන්න සේවක සංඛ්‍යාවක්ද වැඩෙහි යොදවා තිබුණි. ක්‍රියාකාරිත්වය පහසුවූයේ මේ සියළු පිරිස් නියමිත කාර්යයන් සඳහා පුහුණුකර නිසි-සේ සේවයේ යොදවා තිබුණු නිසා ය.

## ඔලිම්පික් සංවිධායක කමිටුව

**(LOCOG)** (London Organising Committee of the Olympic and Paralympic Games)

ලන්ඩනයට 2012 ඔලිම්පික් පවත්වන්නට වරම ලැබුණ බව 2006 දී ස්ථිරවූ සැනින් එවකට තිබුණු බ්‍රිතාන්‍ය රජය වහා ක්‍රියාකාරී විය. විවිධ විද්වතුන්ගේ අදහස් විමසා එයට සුදුසු කමිටුවක් පත්කරන ලදී. එයට රජයේ මැති ඇමතිවරුන් කිසිවෙකුගේ ඇඟිලිගැසීමක් නොවීය.

බ්‍රිතාන්‍යයේ නමගිය ධාවන ශූරයෙකු මෙන්ම, කලින් ඔලිම්පික් තරඟ කීපයකදී රන්පදක්කම් දිනූ, දැනට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ද වන අතර, ක්‍රීඩාවට වූ සේවය සළකා නයිට් නාමයෙන් පිදුම් ලද සර් සෙබස්තියන් කෝ ලන්ඩන් ඔලිම්පික් කමිටුවේ සභාපතිවරයා ලෙස පත්කරන ලදී. එසේම කමිටුවේ අනෙක් සම්භාවනීය පිරිසට මහරැජිණගේ දියණිය වන ඈන් කුමරිය, ශ්‍රීමත් කීත් මිලර්, ශ්‍රීමත් චාර්ල්ස් ඇලන් සහ ශ්‍රීමත් පිලිප් ක්‍රේවන් යන අය ද අයත් වූහ. තව ද ඒ ඒ කාර්යයන් සඳහා විශේෂ දැනුමැති පුද්ගලයින්ගෙන් සමන්විත ජ්‍යෙෂ්ඨ කමිටුවක් ද සාදාගන්නා ලද්දේ ය.

2012 දක්වා ඇති ඉදිරි වර්ෂ පහ තුළ සියල්ල සම්පූර්ණ කරගත යුතු බවත් ඊට දළ වශයෙන් පවුම් බිලියන 9 ක් වැයවන බවත් අධිකාරිය වටහාගත්තේය. මූලික ක්‍රීඩාංගනය සහ තරඟ පැවැත්වෙන වෙනත් පිටස්තර ස්ථානයන් හි අවශ්‍ය ගොඩනැගිලි සහ පහසුකම් තැනීම අධිකාරියට පැවරුණු කාර්යයකි. අවශ්‍ය මුදල් සපයාගැන්ම පුද්ගලික සමාගම්, ආයතන මගින් සහ ජනතාව මූලිකව කරගැන්මට තීරණය විය.

මේ සියල්ල අතරේ දත යුතු වැදගත්ම කාරණය නම් මෙම සියළු ඔලිම්පික් සංවිධාන කටයුතු වලට කිසිදු බ්‍රිතාන්‍ය දේශපාලකයෙකු ගැවුණේවත් නැති බවයි. කමිටුව වටපිට නොබලා තමන් අතගැසූ කාර්යය දිගටම කරගෙන ගියේ ය.

## මුහුණ දුන් නොසිතූ සිදුවීම්

මේ අතරට නොසිතූ සිදුවීම් කීපයක් ද කඩාවැටුණේය. එනම්:

**1.** බටහිර 2008 දී විශාල බැංකු අර්බුදයකට මුහුණ පෑම නිසා බ්‍රිතාන්‍යය ඇතුළු යුරෝපයේ රටවල් කීපයකම ආර්ථික යට මරුපහරක් එල්ල විය. බැංකු ගොඩ ගන්නට අනෙක් රටවල සහාය පතන්නට සිදුවූ අතර බ්‍රිතාන්‍යයද ආර්ථික වශයෙන් අවදානම් තත්වයක බව පෙනුණි. මේ නිසා ඔලිම්පික් කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයන්නේ කෙසේදැයි යන්නද ඇතිවූ මහා ගැටළුවයි. ඒ අනුව 2012 දී ඔලිම්පික් පවත්වන්නට බැරි තත්වයක් ඇතිවේයයි බොහෝ දෙන සැක පහළ කරන්නට වූහ.

**2.** 2008 දී ලන්ඩන් නගරයේ නගරාධිපති ඡන්දය පැවැත්විණ. එය නව පුද්ගලයෙකු පත්විය හැකි, එසේම ලන්ඩන් නගර පාලනයද වෙනස් මගක් ගත හැකව තිබූ තත්වයකි. සැබැවින්ම චීනයේ බේජිං හි ඔලිම්පික්වලට ගොස් ඊළඟ ඔලිම්පික් පැවැත්වීමේ වගකීම බාරගත්තේ ඒ ලන්ඩනයේ පත්වූ අළුත් කොන්සර්වේටිව් නගරාධිපතිවරයාය.

**3.** 2010 දී බ්‍රිතාන්‍යයේ මහ මැතිවරණයක් පැවැත්විණ. එයද පාලනය වෙනස් කළ මැතිවරණයකි. ඒ තත්වයද ඔලිම්පික් වලට දැඩිව බලපාන්නට තිබුණු බව නිරීක්ෂකයන්ගේ අදහස වීය.

**4.** 2011 එනම් ගිය වසරේ ලන්ඩනයේ විශාල කලකෝලහල තත්වයක් ඇතිවිය. කඩ සාප්පු ගිනිතැබීම්, දේපළ හානි විශාල වශයෙන් සිදුවිය. එම තත්වය සැබැවින්ම මේ වසරේ පැවැත්වෙන ඔලිම්පික් තරඟ වලට විශාල තර්ජනයක් වනු ඇති බවත්, සියළු ඔලිම්පික් අරමුණු බිඳවැටෙනු හැකි බවත් බොහෝ දෙනාගේ අදහස විය.

**ලන්ඩන් ඔලිම්පික් සාර්ථකවීමට මූලික හේතුව එයට කිසිදු දේශපාලකයෙක් නොගෑවීමයි. දේශපාලනය හා ක්‍රීඩාව මෙහි මිශ්‍ර කරගෙන නැත !**

එම තත්වය තුළ දැනට ඇතිවාටත් වඩා ත්‍රස්තවාදී සතුරුකරදර ගලාවිත් බෝම්බ පිපිරවීම් ආදියෙන් ඔලිම්පික් ආරක්ෂා වැඩපිළිවෙල මුළුමනින් කඩාකප්පල් වේයයි සැක සිතෙන තත්වයක් ද ඇතිවිය.

## ඉහත දැක්වූ කරුණු 4 ට දැක්වූ ප්‍රතික්‍රියා සහ ඉන් උගත් පාඩම්

ඉහත සිදුවේයයි අනුමාන කළ, සැක කළ කාරණා හතර ම නිසැකවම සිදුවිය හැකි තත්වයක් තිබිණ. එසේ වී නම් ඔලිම්පික් කාර්යය විශාල අකරතැබ්බකට මුහුණ පාන්නට තිබිණ. එහෙත් ඒවා සිදු නොවූයේ බොහෝ විට මේ නිසාය. එනම්:

**1.** (බැංකු අර්බුදය) එවකට බලය ලත් වර්තමාන රජය වැටුණු ආර්ථිකය යම් පමණකට ක්‍රමවත්ව ඉහළ නංවන ලද අතර, ඔලිම්පික් ක්‍රීඩාවලට වියදම් කරන්නට අරමුදල් ප්‍රමාණවත්ව තබා තිබෙන බවට ජනතාවට සහතික විය.

**2.** සහ **3.** නගරාධිපති තේරීමේදීත්, මහ මැතිවරණයේදීත් දක්නට ලැබුණු යහපත් ලක්ෂණයක් වූයේ රජයේ හෝ විපක්ෂයේ හෝ කිසිදු ඡන්ද අපේක්ෂකයෙක් ලන්ඩන් ඔලිම්පික් ඡන්දය දිනන තුරුම්පුවක් ලෙස පාවිච්චි කළේ නැති වීමයි. කවුරු බලයට ආවත් ලන්ඩන් ඔලිම්පික් වලට එය හානියක් නොවූයේ ඒ නිසා ය.

**4.** ලන්ඩන් කලකෝලාහල - බ්‍රිතාන්‍යයේ මෑතක වූ අතිශය හානිදායී සිදුවීම එයයි. එහෙත් එය ක්‍රමයෙන් නිවීගොස් සමාජය යථාතත්වයට පත්වීම ද, මහ ජනතාවත් විශේෂයෙන් තරුණපෙළත් එම කළහකාරී තත්වය අමතක කර දැමීමද වාසනාවකි. ඔලිම්පික් ක්‍රීඩා ලන්ඩන් නගරයේ පවත්වන බව ඇසුණු දා සිට එය සාර්ථකකරගැන්ම සඳහා සියළු ජාතීන්ට අයත් තරුණ සහ වැඩිහිටි සමස්ථ බ්‍රිතාන්‍ය ජනතාවම සිය දේශපාලන පක්ෂය කුමක් වුවද එය ජාතික කටයුත්තක් සේ සලකා ඒකීය සිතින් ක්‍රියා කිරීම ඔලිම්පික් සාර්ථකත්වයේ රහසයි.

## ඔලිම්පික් සමග නොගෑවුණු බ්‍රිතාන්‍ය දේශපාලනය

දේශපාලන වශයෙන් කිසියම් මැදිහත්වීමක් වූයේ නම් එය ඔලිම්පික් ක්‍රියාකාරිත්වයට හානියක් වනවා නොඅනුමානය. දේශපාලකයන් මේ ක්‍රියාදාමයෙන් ඈත්කර තැබුවා සේ හැඟෙයි. එසේ නැතහොත් දේශපාලකයින් තුමූම ඔලිම්පික්වලින් ඈත්වී සිටිය යුතුයයි සිතුවා දැයි නොදනිමු. ඒ කවරක් වුවද පටන්ගැන්මේ සිට ඔලිම්පික් ගිය සතියේ අවසන් වනතුරා එහි සංවිධාන කටයුතුවල කිසිදු අංශයකට බ්‍රිතාන්‍ය දේශපාලනඥ ගැවීමක් නොවීය.

ශ්‍රීලංකාවේ මෙන් දේශපාලනය හා ක්‍රීඩාව මිශ්‍රවී මෙහිද තිබුණා නම් ඔලිම්පික් උළෙල මහා විකාර ව්‍යසනයකින් කෙළවර වන්නට තිබුණි. ක්‍රීඩාවට දේශපාලනය නොගැවීම වාසනාවකි.

ලන්ඩන් ඔලිම්පික් ක්‍රීඩා සිදුවුනු සියලු කාලය මුලුල්ලේ එය නරඹන්නට පැමිණ සිටි අගමැතිවරයා ද මැති ඇමතිවරුද ප්‍රේක්ෂකයින් සමග තමනට වෙන්කළ ආසන වල හිඳගෙන තරඟ නැරඹුවා විනා ගුරුහරුකම් දෙන්නට හෝ රූපවාහිනී කැමරාවලට පණ්ඩිතකම් කියන්නට හෝ ගියේ නැත. ජනතාව වුවද ඔවුන් සිටින බවක් දුටුවේ ඇතැම් විටක කලාතුරකින් ක්‍රීඩකයෙකුට පදක්කමක් පළඳවන්නටයයි ඔලිම්පික් කමිටුවෙන් කිසියම් ඇමතිවරයෙකුට ආරාධනා කළ විටකදී පමණය. ඒ කාර්යය ඉටුකර ඔහු නැවත පැමිණ තම අසුනේ හිඳගනී. මාධ්‍යකරුවන්ද රූපවාහිනී කැමරා අටවාගෙන එතැන කිසිදු මැති ඇමති කෙනෙක් පසුපස දුවගියේ නැත.

ශ්‍රීලංකාවට ඉතාම අඩුවක්ව පවතින දේශපාලන හික්මීම යනු මෙයයි. රටක කටයුතු දේශපාලකයන්ගේ ඇඟිලිගැසීමෙන් තොරව කරගන්නට බැරිවීම සියළු අවුල්වලට හා රටේ පිරිහීමට මුලය. මෙම 2012 ඔලිම්පික් තරඟාවලියෙන් අප රටේ ජනතාවට මාධ්‍යයට හා බලයේ සිටින අයට උගතහැකි පාඩම් බොහෝය. වඩාත්ම වැදගත් දේ නම් ඉතාම අමාරුකම් අපහසුතා හා අනේක කරදර හමුවේ මෙවැනි අතිශය දුෂ්කර කාර්යයක් කිසිදු අඩුවක් කියන්නට නොහැකිවන අයුරින් සාර්ථකව නිම කළේ කෙසේද යන්න කල්පනාවට ගැනීමයි ! අපේ අය එසේ කල්පනා කරාවිද යන්න ගැන නම් අපට කිව නොහැකිය.


♦ **සංජය**




Archery - China



Womens Hurdle South Africa



Double Gold Medalist Runner -Mo Farah -UK




Usain Bolt representing Jamaica in 100m, 200m& 4x100m relay races at 2012 London Olympics

## අද දින මිහිමත වේගවත්ම මිනිසා උසේන් බෝල්ට්

## Usain Bolt - the fastest man on Earth

**won 3 Gold Medals for all events he took part. He is the highest paid athlete ever in track and field. He has been called the world's most marketable athlete and the greatest athlete ever.**